**කෘෂිකර්ම අමාත්‍යාංශය**
**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**

**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ සහකාර කොමසාරිස් III පන්තියේ (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා අයදුම්පත් කැඳවීම**

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ, සහකාර කොමසාරිස් III පන්තියේ (දෙපාර්තමේන්තුමය) තනතුරු 17 ක පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. බඳවා ගැනීමේ ක්‍රමය**

සීමිත තරඟ විභාගයක් හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**02. අවශ්‍ය සුදුසුකම්**

I. ගොවිජන සංවර්ධන නිලධාරී සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.

II. ගොවිජන සංවර්ධන නිලධාරී I ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහක (05) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු වීම.

III. උසස් වීම් දිනට පූර්වාසන්නතම වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

IV. ගොවිජන සංවර්ධන නිලධාරී I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වී තිබීම.

**03. කායික සුදුසුකම්**

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**04. වෙනත් සුදුසුකම්**

දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සහ වෙබ් අඩවියේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**05. සේවායේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි**

I. මෙම සේවය සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන්, රාජ්‍ය සේවයේ පත්වීම් සඳහා බලපාන පොදු කොන්දේසි මත, සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා වූ බඳවා ගැනීමේ පටිපාටියෙහි කොන්දෙසි වලට යටත් විය යුතුය.

II. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු / වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

III. පත්වීම අවුරුද්දක වැඩ බලන කාලයකට යටත්ය. සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුරට බඳවා ගෙන වසර 03 ක් ඇතුලත ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් III ශ්‍රේණියේ නිළධාරීන්ගේ පළමු වන කාර්යක්ෂමතා විභාගය සමත් විය යුතුය.

IV. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැදී වසර 05 ක් ඇතුළත සේවාවට බැදූ නියමිත මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

V. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වලටද, ශ්‍රී ලංකා ප්‍රජාතානප්‍රජාතාන්ත්‍රික ප්‍රජසමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසි වලටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග වලට ද මෙම පත්වීම යටත් වේ.

**06.** **වැටුප් පරිමාණය**

2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු.47,615 – 10 x 1335 – 8 x 1,630 -17 x 2,170 – 110,895/= (SL- 1-2016) වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛන 11 හි සදහන් පරිදි වේ.

**07.** **තෝරා පත් කර ගන්නා ක්‍රමය**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පවත්වනු ලබන සීමිත තරඟ විභාගයක ප්‍රතිඵල මත සුදුසුකම් ලැබූ,බඳවා ගැනීමට අපේක්ෂිත නිලධාරි සංඛ්‍යාව මෙන් දෙගුණයක් සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා, එහිදී ලබා ගන්නා ලකුණු සහ තරඟ විභාගයේ ප්‍රතිඵලවල එකතුව මත ලබා ගන්නා කුසලතා අනුපිළිවෙල පදනම් කරගෙන බඳවා ගැනීම් සිදු කෙරේ.

**08.** **ලිඛිත විභාගය**

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ගොවිජන සංවර්ධන නීති හා ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ප්‍රවණතා | පැය 02 | 100 | 40% |
| සිද්ධි අධ්‍යයනය | පැය 02 | 100 | 40% |

**09) විභාගය සඳහා වන විෂය නිර්දේශය**

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. ගොවිජන නීති හා ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ප්‍රවණතා | • 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත හා එහි අන්තර්ගත විධිවිධාන පිළිබඳ අවබෝධය<br>• ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ අවබෝධය<br>• කෘෂි සංවර්ධනය සඳහා වන ආයතනික කටයුතු<br>• කෘෂිකාර්මික වෙළඳපොල |
| 2. සිද්ධි අධ්‍යයනය | පහත සඳහන් ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි සිද්ධි අධ්‍යයනය ප්‍රශ්න දෙකකින් ඉදිරිපත් කරනු ලැබේ.<br>• 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත<br>• කළමනාකරණ මූලධර්ම |

**10. සම්මුඛ යෝග්‍යතා ඇගයීමේ පරීක්ෂණය**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.
සේවා පළපුරුද්ද හා කුසලතාවය මත ලකුණු 100 ක් ලබා දේ.

**11. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමේ පටිපාටිය**

| | |
|---|---|
| **සේවා පළපුරුද්ද සඳහා** | ලකුණු 60 |
| ගොවිජන සංවර්ධන නිළධාරී සේවයේ I වන පන්තියේ වසර පහකට (05) වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සෑම වසරක් සඳහාම වසරකට ලකුණු 05 බැගින්/ ගොවිජන සංවර්ධන නිලධාරී විශේෂ ශ්‍රේණියේ වසරකට ලකුණු 05 බැගින් වන පරිදි උපරිම ලකුණු 60. | |
| **කුසලතාවය සඳහා** | ලකුණු 35 |
| අතිරේක අධ්‍යාපන සුදුසුකම්<br>(මූලික සුදුසුකමට අමතරව)<br>පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත්<br>a පශ්චාත් උපාධියක් සඳහා ලකුණු 15<br>b පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා ලකුණු 15 | |
| විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ආයතනයක ඕනෑම විෂය ක්ෂේත්‍රයක<br>a උපාධියක් සඳහා ලකුණු 10<br>b ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (අවුරුදු 01ක් හෝ ඊට වැඩි) ලකුණු 06<br>(උපරිම සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබාදේ) | |
| **සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව** | ලකුණු 05 |

**12.** අයදුම් කරන ආකාරය

I. ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් අගල් 8 $^{1}/_{2}$ X 12 (A4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අපේක්ෂකයා විසින් පිරවිය යුතුය.

II. සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය 2018.09.20 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, අංක 28/10 , මලලසේකර මාවත, කොළඹ 07යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. (ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම්පස කෙලවරේ පැහැදිලිව "ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුරට බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කල යුතුය.නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

III. අයදුම්කරු විසින් විභාග ගාස්තු වශයෙන් ගෙවිය යුතු රු:1000/= ක මුදල ඕනෑම ගොවිජන සේවා මධ්‍යස්ථානයකට ගෙවිය යුතු අතර, ගොවිජන සේවා මධ්‍යස්ථානය මගින් මුදල් භාර ගත් බවට ගො.සේ.ම / 2(අ) කුවිතාන්සිය අයදුම්කරුට ලබා දෙනු ඇත. එම කුවිතාන්සිය අයදුම්පත්‍රයේ නම් කරන ලද ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. මතු ප්‍රයෝජනය සඳහා කුවිතාන්සියේ පිටපතක් ළඟ තබා ගැනීම සුදුසුය. කුමන හේතුවක් නිසා හෝ එම මුදල ආපසු ගෙවනු නොලැබේ.

IV. අත්සන සහතික කිරීම

විභාගය සඳහා වන ප්‍රවේශපත්‍රයේ අයදුම්කරුගේ අත්සන තම ආයතන ප්‍රධානියා මගින් සහතික කරවා ගත යුතුය. විභාගය ආරම්භ වන දිනයේ ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රයයි. එසේ අත්සන සහතික කරවා නොගත් ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් කරන අයදුම්කරුවෙකුට විභාගයට පෙනී සිටීමට අවසර නොලැබෙනු ඇත.

V. අයදුම්කරුගේ අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත හෝ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රය පමණක් පිළිගනු ඇත.

VI. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.ඉල්ලුම් පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලබන අතර, ඉල්ලුම්පත්‍ර ලැබුනු බව දන්වනු නොලැබේ.

VII. ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කල අය අතරින් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට ලිඛිත විභාගය සඳහා පෙනී සිටීමට ප්‍රවේශ පත්‍ර ලැබෙන අතර, අනතුරුව ලිඛිත විභාගයෙන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් හට සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ ලිපි නිකුත් කරනු ලැබේ.

**13.** **සාවද්‍ය තොරතුරු සැපයීම**

ඔබ විසින් එවන ලද අයදුම් පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාල ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**14**. මෙම නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි වන්නේය. එමෙන්ම පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම හෝ පුරප්පාඩු වලින් කොටසක් පිරවීම පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

...................................................
...................................................

ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්,
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව.

දිනය:............